චක්‍රලේඛ ලිපි අංක 8/2015

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2015
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10.
2015.12.29

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ ත්‍රිවිධ හමුදාපතිවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**නව විශ්‍රාමික හැඳුනුම්පත නිකුත් කිරීම (Visa හා NFC පහසුකම් සහිත)**

මවිසින් නිකුත් කරන ලද 2015.06.01 දිනැති 04/2015 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය කෙරේ අවධානය යොමුකරවමි.

02. උක්ත චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද නව විශ්‍රාමික හැඳුනුම්පත ලබාදීම සඳහා අයදුම්පත් සම්පූර්ණ කිරීම හා ඡායාරූප ලබාගැනීම සිදු කරනු ලබන්නේ දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති සේවා කවුළුව (සත්කාර පියස) මගිනි. එමගින් ලබාගන්නා තොරතුරු පදනම් කරගනිමින් නව විශ්‍රාමික හැඳුනුම්පත ලබාදීමට කටයුතු කිරීම දැනට පවත්වාගෙන යනු ලබන ක්‍රමවේදයයි.

03. මෙම කාර්යය තවදුරටත් කාර්යක්ෂමව හා වඩාත් නිවැරදිව ඉටු කිරීම සඳහා නිලධාරීන්/ නිලධාරිනියන් විශ්‍රාම ගන්වනු ලබන අවස්ථාවේදී යොමු කරනු ලබන PD 03 අයදුම්පතට ඇමුණුමක් ලෙස හඳුන්වා දෙනු ලබන මෙම දත්ත පත්‍රිකාවද සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය. එසේම මෙම දත්ත පත්‍රිකාව සමඟ නිලධාරියාගේ/ නිලධාරිනියගේ හා කලත්‍රයාගේ පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් ඉදිරිපත් කළ යුතුය. (අදාළ ඡායාරූප මතුපිට කිසිවක් ලිවීම හෝ පළුදු කිරීමක් සිදු නොකළ යුතුය)

04. මෙසේ දත්ත පත්‍රිකාව හා ඡායාරූප PD 03 අයදුම්පත සමඟ යොමු කිරීම මගින් උක්ත සම්මුඛ පරීක්ෂණයේදීම අදාළ නව විශ්‍රාමික හැඳුනුම්පත විශ්‍රාමික නිලධාරීන්ට/ නිලධාරිනියන්ට ලබාදීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කල හැකිවේ.

05. එබැවින් මේ සඳහා ඔබගේ අවධානය යොමුකර අදාළ නිලධාරීන්ට විධිමත් උපදෙස් ලබාදීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

එස්.එස්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම් - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
4. ලේකම් - මුදල් අමාත්‍යාංශය
5. විගණකාධිපති - අ.ක.ස.

# Data Form for Pensioner's ID

Passport size
(40X35mm)
Color photo

40 mm

35 mm

Please fill the form in BLOCK LETTERS

Title :- Rev ☐ Mr ☐ Mrs ☐ Ms ☐

Full Name:-

Ex: - DILSHAN CHATHURANGA JAYANATHA KUMARASENA

How the name should Appear on ID:-

Ex: - D.C.J KUMARASENA

Address:-

NIC No:-

Pension No:-

W&OP No:-

Date of Retire:-

Contact No:-

Date: ..........................................

..........................................
Signature

Send to: - Pen ID, Department of Pensions, Maligawatta, Colombo 10, and Sri Lanka
Hot Line: - 0115927104
Email: -penid@pensions.gov.lk